ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No. HRC/K/364/13 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2019- 08 - 08


පැමිණිලිකරු/වන් : ලේකම්,
කම්කරු සහයෝගීතා වෘත්තීය සමිතිය,
අංක 114/15 ඒ, බෝගොඩවත්ත පාර,
සුදුහුම්පල, මහනුවර.

වගඋත්තරකරුවන් :

1. සභාපති,
ජනතා වතු සංවර්ධන මණ්ඩලය,
55/75, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

2. සභාපති,
ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව,
නො . 11, ආදිපාද වීදිය,
කොළඹ 01.

3. අධ්‍යක්ෂ,
ඇල්කඩුව වැවිලි සමාගම,
හුනුගල්ල වතුයාය,
ඇල්කඩුව.

4. ලේකම්,
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය,
08, 10, 11 වන මහල, සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

5. ලේකම්,
කම්කරු අමාත්‍යාංශය,
නාරාහේන්පිට, කොළඹ 05.

6. ලේකම්,
මුදල් අමාත්‍යාංශය,
කොළඹ 01.

7. කම්කරු කොමසාරිස් ජනරාල්,
කම්කරු දෙපාර්තමේන්තුව,
නාරාහේන්පිට, කොළඹ 05.

8. මහ බැංකු අධිපති,
ශ්‍රී ලංකා මහ බැංකුව,
කොළඹ 01.

9. ලේකම්,
රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර සංවර්ධන අමාත්‍යාංශය,
7 වන මහල, බටහිර කුළුණ සහ 36 වන මහල,
නැගෙනහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය,
ඇව්ලන් චතුරශ්‍රය, කොළඹ 01.

පැමිණිලි අංකය : **HRC/K/364/13, HRC/4682/13, HRC/4683/13, HRC/4684/13, HRC/4685/13, HRC/4586/13, HRC/4687/13**

පැමිණිල්ල :-

ඉහත පැමිණිලි පාර්ශවය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් පහත කරුණු ඉදිරිපත් කර ඇත.

ශ්‍රී ලංකාවේ වතු ක්ෂේත්‍රයේ ප්‍රාදේශීය වතු 22 ක් හා මහා පරිමාණ වතු 450ක් පමණ ඇති අතර, ඒවා දිගුකාලීන බදු ක්‍රමය යටතේ පාලනය කරන බවත්, මෙයින් වතු 31 ක් පමණ රජයට අයත් ජනතා වතු සංවර්ධන මණ්ඩලය (JEDB), රාජ්‍ය වැවිලි සංස්ථාව (SLSPC) හා ඇල්කඩුව වැවිලි සමාගම යටතේ පාලනය වන බවත් ප්‍රකාශ කරයි.

රජයට අයත් ජනතා වතු සංවර්ධන මණ්ඩලය (JEDB) හා රාජ්‍ය වැවිලි සංස්ථා (SLSPC) සහ ඇල්කඩුව වැවිලි සමාගම යන වතුවල සේවය කරන ආසන්න වශයෙන් 12000ක පමණ වතු කම්කරුවන් හා වතුකාර්ය මණ්ඩලයට අයත් රුපියල් මිලියන 1888ක් සේවක අර්ථසාධක අරමුදල, සේවක භාරකාර අරමුදල හා විශ්‍රාම පාරිතෝෂික දීමනා ලෙස ගෙවිය යුතුව ඇති බවට වතු කම්කරුවන් ප්‍රකාශ කරන බවත්, ඒ පිළිබඳ ජනමාධ්‍ය මඟින් වරින්වර ප්‍රචාරණය වන බවත්, කම්කරු සහයෝගීතා වෘත්තීය සමිතිය විසින් මෙම පැමිණිල්ල මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර ඇත.

JEDB, SLSPC හා ඇල්කඩුව වැවිලි සමාගම යන වතුවල කම්කරුවන් හා වතු කාර්ය මණ්ඩලයට ලබා දියයුතු හිඟ සේවක අර්ථසාධක අරමුදල, සේවක භාරකාර අරමුදල හා විශ්‍රාමික පාරිතෝෂික දීමනා පිළිබඳ විස්තර පහත පරිදි වන බවට සඳහන් කර ඇත.

| | ජනතා වතු සංවර්ධන මණ්ඩලය(JEDB) | රාජ්‍ය වැවිලි සංස්ථාව (SLSPC) | ඇල්කඩුව වැවිලි සමාගම | එකතුව රු. මිලියන |
|---|---|---|---|---|
| සේවක අර්ථසාධක අරමුදල | රු.මිලියන 552 | රු.මිලියන 480 | රු.මිලියන 140 | රු.මිලියන 1,172 |
| සේවක භාරකාර අරමුදල | රු.මිලියන 23 | රු.මිලියන 29 | රු.මිලියන 06 | රු.මිලියන 58 |
| විශ්‍රාමික පාරිතෝෂික දීමනා | රු.මිලියන 310 | රු.මිලියන 155 | රු.මිලියන 193 | රු.මිලියන 6.58 |
| එකතුව | රු.මිලියන 885 | රු.මිලියන 664 | රු.මිලියන 339 | රු.මිලියන 1,888 |

මෙහිදී වතු කම්කරුවන්ට ගෙවිය යුතු මුළු මුදලින් රු.මිලියන 885 ක් ජනතා වතු සංවර්ධන මණ්ඩලය (JEDB) විසින්ද, රු. මිලියන 664 ක් රාජ්‍ය වැවිලි සංස්ථාව (SLSPC) විසින්ද, රු.මිලියන 339 ක් ඇල්කඩුව වැවිලි සමාගම විසින්ද ගෙවිය යුතු බව ප්‍රකාශ කර ඇත.

එසේම, ප්‍රාදේශීය වැවිලි සමාගම්වලට අයත් වතුවල සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදලට මුදල් ලබා දෙන නමුත්, රජය විසින් පාලනය කරනු ලබන JEDB, SLSPC හා ඇල්කඩුව වැවිලි සමාගම යන ආයතනවලට අයත් වතුවල පසුගිය වසර 10 කට වැඩි කාලයක් කම්කරුවන්ගේ වැටුපෙන් අය කර ගන්නා ලද සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදලට දායක මුදල් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ප්‍රේෂණය කර නොමැති බවද දක්වා ඇත. එමෙන්ම, විශ්‍රාමික කම්කරුවන්ට හිමිවිය යුතු විශ්‍රාම පාරිතෝෂික මුදල නොලැබෙන බවටද පැමිණිලි පාර්ශවය ප්‍රකාශ කර ඇත.

ඉහත සඳහන් කම්කරු අයිතිවාසිකම් උල්ලංඝනය සම්බන්ධව මහනුවර මාතලේ හා අනෙකුත් දිස්ත්‍රික් කම්කරු කාර්යාලවලට කම්කරුවන් හා වෘත්තීය සමිති පැමිණිලි ඉදිරිපත් කර ඇති නමුත්, මෙම පැමිණිලි සම්බන්ධව කම්කරු කාර්යාලය විසින් වතු අධිකාරීවරුන්ට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග ඉතාමත් මන්දගාමී බවත් එම නිසා පහත පනත්උල්ලංඝනය වී ඇති බවත් පැමිණිලි පාර්ශවය සඳහන් කර ඇත.

- 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල පනත
- 1980 අංක 46 දරණ සේවක අර්ථසාධක අරමුදල පනත
- 1983 අංක 12 දරණ විශ්‍රාම පාරිතෝෂික දීමනා පනත
- ILO ප්‍රඥප්තිය හා ජාත්‍යන්තර කම්කරු සම්මතයන්

ඒ තුළින් පැමිණිලි පාර්ශවයේ නීතියේ රැකවරණය අහිමිවී ඇති බවත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව උල්ලංඝණය කරමින් වෙනස් කමකට භාජනය වී ඇති බවත් ප්‍රකාශ කර ඇත.

1. ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ JEDB කරුණු දැක්වීම :-

ඉහත පැමිණිල්ලට අදාළව 2017.06.21 මානව හිමිකම් කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ පැවති පරීක්ෂණයේදී ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ සභාපති වෙනුවෙන් එම ආයතනයේ ගණකාධිකාරී

එන්.ජී.එන්. රණසිංහ හා කළමණාකාර නීති, අසේල රාජපක්ෂ මහතා පෙනී සිට පැමිණිල්ලට අදාළ පහත කරුණු ඉදිරිපත් කර ඇත.

ජනතා වතු සංවර්ධන මණ්ඩලය රජයට අයත් වැවිලි ආයතනයක් බවත්, ප්‍රමාණවත් මුදල් නොමැති වීම නිසා 2000 වසරේ සිට සේවකයන්ට ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල, සේවක භාරකාර අරමුදල හා පාරිතෝෂික දීමනා ගෙවා නොමැති බවට පැමිණිලි පාර්ශවය ඉදිරිපත් කරන චෝදනා පිළිගන්නා බව ප්‍රකාශ කර ඇත.

එම සමාගම විසින් 2017.03.31 දින වන විට රුපියල් මිලියන 1463 සේවකයන්ට ගෙවීමට ඇති බවත්, පාරිතෝෂික මුදල් සමඟ එම මුදල රුපියල් මිලියන 1500 ක් වන බවත් ප්‍රකාශ කර ඇත.

මෙම ගෙවීම සඳහා ආයතන සතුව ප්‍රමාණවත් මුදල් නොමැති වීම මත රාජ්‍ය භාණ්ඩාගාරයේ මුදල් ප්‍රතිපාදන ඉල්ලා ඇති බවත් රාජ්‍ය භාණ්ඩාගාරයෙන් වරින් වර මේ සඳහා මුදල් ප්‍රතිපාදන ලබා දී ඇති නමුත් එම මුදල්ද ප්‍රමාණවත් වී නොමැති බව ප්‍රකාශ කර ඇත.

සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල් සම්බන්ධයෙන් නඩු පැවරීම් සිදු වන විට රාජ්‍ය භාණ්ඩාගාරයෙන් මුදල් ලබා ගෙන ගෙවීම් කර ඇති බවද ප්‍රකාශ කර ඇත. කෙසේ වෙතත් 2017.12.31 දින වන විට ඉහත මුදල ගෙවීමට ඇති බව වගඋත්තරකරුවන් ප්‍රකාශ කර ඇත.

මේ සඳහා මුදල් සපයා ගැනීමේදී විකල්ප ක්‍රම ලෙස ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු හිස් ඉඩම් පුද්ගලික අංශය සහ සම්බන්ධ වී ව්‍යාපෘති ඇති කිරීම, හා වතුවල තිබෙන ගස් කපා ඒවා විකිණීමෙන් ලැබෙන ආදායම මේ සඳහා යොදා ගැනීම යෝජනා වී ඇතත් එමඟින් සාර්ථක ප්‍රතිඵල මෙතෙක් ලැබී නොමැති බව වගඋත්තරකරුවන් ප්‍රකාශ කර ඇත.

2. රාජ්‍ය වැවිලි සංස්ථාවේ (SLSPC) කරුණු දැක්වීම :-

2017.06.21 දින මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ මෙම පැමිණිල්ලට අදාළව පැවති පරීක්ෂණයේදී රාජ්‍ය වැවිලි සංස්ථාවේ සභාපති වෙනුවෙන් කළමණාකාර නීති ආර්. කේ. දෙහිදෙනිය මිය විසින් පහත කරුණු ඉදිරිපත් කර ඇත.

සේවකයන් වෙනුවෙන් ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල, සේවක භාරකාර අරමුදලට හා පාරිතෝෂික දීමනා 2000 වසරේ සිට, ආයතනය සතුව ඒ සඳහා ප්‍රමාණවත් මුදල් නොමැති වීම මත ගෙවා නොමැති බවත්, ගෙවීමට ඇති මුදල රුපියල් මිලියන 300 ක් පමණ වන බවත් ප්‍රකාශ කර ඇත.

රාජ්‍ය වැවිලි සංස්ථාවේ නව අධ්‍යක්ෂ මණ්ඩලය පත් වී සුළු කාලයක් බවත්, රාජ්‍ය භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර මුදල් ප්‍රතිපාදන වෙන් කරවා ගැනීමට කටයුතු කරමින් සිටින බවත් ප්‍රකාශ කර ඇත

ආයතනය සතු වතුවල ඇති ගස් කපා විකිණීම තුළින් රුපියල් මිලියන 100 ක් පමණ ලබා ගත හැකි බව ප්‍රකාශ කරන අතර, එය රාජ්‍ය භාණ්ඩාගාරයේ අනුමැතිය යටතේ සිදු විය යුතු බවත් ප්‍රකාශ කර ඇත. මේ සඳහා ප්‍රමාණවත් මුදල් රාජ්‍ය භාණ්ඩාගාරයෙන් සැපයිය යුතු බවත් මෙම වගඋත්තරකරු ප්‍රකාශ කර ඇත.

3. ඇල්කඩුව වැවිලි සමාගමේ කරුණු දැක්වීම :-

2017.07.21 දින මානව හිමිකම් කොමිෂන් සභාවේ විමර්ශනය සඳහා පෙනී සිටින ලෙස සිතාසි නිකුත් කර ඇතත්, ඇල්කඩුව වැවිලි සමාගම වෙනුවෙන් කිසිවකු පෙනී සිට නොමැත. ඒ අනුව කරුණු දැක්වීමක් නොමැත.

4. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ කරුණු දැක්වීම :-

2017.07.21 දින මානව හිමිකම් කොමිෂන් සභාවේ විමර්ශනය සඳහා පෙනී සිටින ලෙස සිතාසි නිකුත් කර ඇතත් පෙනී සිට නොමැත. ඒ අනුව කරුණු දැක්වීමක් නොමැත.

5. කම්කරු අමාත්‍යාංශයේ ලේකම් වෙනුවෙන් කරුණු ඉදිරිපත් කිරීම :-

2017.07.21 දින මානව හිමිකම් කොමිෂන් සභාවේ පැවති පරීක්ෂණයේදී 5 වන වගඋත්තරකරු වෙනුවෙන් නීති නිලධාරි කේ.ජී. කුමාරසිංහ මහතා කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, කම්කරු කොමසාරිස්ගේ රාජකාරිය වනුයේ යම්කිසි ආයතනයක් විසින් සේවකයන්ට සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල හෝ පාරිතෝෂික දීමනා නොගෙවයි නම් ඔවුන්ට විරුද්ධව අධිකරණයේ නඩු පැවරීම වන බවත් නඩු පවරනවා යනු පනතේ ඇති අවසාන විසඳුම වන බවත්ය.

මෙම ආයතන විසින් සේවක අර්ථසාධක අරමුදල, සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල හා පාරිතෝෂික මුදල් සේවකයන්ට ගෙවා නොමැති බව පිළිගනු ලබන නමුත් එම ආයතන විසින් දන්වා ඇත්තේ ගෙවීමට ඔවුන් සතුව මුදල් නොමැති බවට වන බැවින් පනතේ ප්‍රතිපාදනවලට අනුව නඩු පැවරීම සිදු කර ඇතත් ප්‍රායෝගික හේතු මත එම නඩු කල් යන තත්වයක් ඇති බවත් වගඋත්තරකරුවන් අධිකරණයට ඉදිරිපත් නොවීම, අධ්‍යක්ෂ මණ්ඩල විසිරුවා තිබීම යන කරුණු ඒ අතර වන බවත් දන්වා ඇත. නමුත් මේ සඳහා පනත ප්‍රකාරව නඩු පැවරීම් කටයුතු පැහැර හැරීමක් සිදු කර නොමැති බව වගඋත්තරකරුවන් ප්‍රකාශ කර ඇත.

6. මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙනුවෙන් කරුණු දැක්වීම :-

මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට සහකාර අධ්‍යක්ෂ ජනරාල් හේමාල් කත්‍රිආරච්චි මහතාද, ගණකාධිකාරී, කේ.පී.ඩී. පී. කරුණාතිලක මහතා සහ නීති නිලධාරී චන්දි විජේසුන්දර මිය, 2017.07.21 දින මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පෙනී සිට පහත පරිදි කරුණු ඉදිරිපත් කර ඇත.

පැමිණිලිකාර පාර්ශවය සඳහන් කරන සේවකයන් වෙත සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල හා විශ්‍රාම පාරිතෝෂික ගෙවීමට ඇති බව අවිවාදයෙන් පිළිගන්නා බව ප්‍රකාශ කර ඇත. ඊට අමතරව මෙම වැවිලි සමාගම් පිහිටුවා ඇත්තේ ලාභ ඉපයීමේ පරමාර්ථයෙන් බවත්, එම ආයතන විසින් උපයන මුදලින් ඉතිරි මුදලක් තිබේ නම් එම මුදල් භාණ්ඩාගාරය වෙත එවීමට කටයුතු කළ යුතු බවත් සඳහන් කර ඇත.

අවාසනාවකට මෙම ආයතන දිගින් දිගටම අලාභ ලැබීම හේතුව මත ජනතා වතු සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සහ ඇල්කඩුව වැවිලි සංස්ථාව යන ආයතන 03 සඳහා 2015 වර්ෂයේ මිලියන 500, 2016 වසරේ මිලියන 600, 2017 වර්ෂයේ මිලියන 700 ක් සේවකයින්ගේ වැටුප් ගෙවීම සඳහා ලබා දී ඇති බව ප්‍රකාශ කර ඇත. එමෙන්ම, එම ආයතනවලට ලැබෙන ආදායමෙන් සේවකයින්ගේ වැටුප් ගෙවීමට නොහැකි බැවින්, එම ආයතන ප්‍රතිසංවිධානය කර ආදායම් ලබන තත්ත්වයට ගෙන එන ලෙස දැනුම් දුන් බව ප්‍රකාශ කර ඇත.

මෙම ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩල භාණ්ඩාගාර චක්‍රලේඛ හා විධිවිධාන වලට පටහැනිව කටයුතු නොකළා නම්, මෙම ආයතනවලට ලැබෙන මුදලින් සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල ගෙවීමට හැකියාව තිබූ බවත්, මොවුන් භාණ්ඩාගාරයට මෙම බර පැටවීම යනු, මහජනතාවගේ බදු මුදලින් අනෙකුත් ආදායම් මාර්ග වලින් ලැබෙන මහජන මුදල් යෙදවීම මහජනතාවට බර පැටවීමක් බවත්, භාණ්ඩාගාරය මෙම මුදල් ගෙවීමට නොහැකි තත්වයක් ඇති වී තිබෙන බවත් ඒ අනුව මෙම ආයතන ප්‍රතිසංවිධානය කර හෝ මෙම මුදල් ගෙවීමට ක්‍රමයක් සොයා ගත යුතු බවත් ප්‍රකාශ කර ඇත.

7. **කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ කරුණු දැක්වීම :-**

2017.07.21 දින මානව හිමිකම් කොමිෂන් සභාවේ විමර්ශනය සඳහා පෙනී සිටින ලෙස සිතාසි නිකුත් කර ඇතත් පෙනී සිට නොමැත. ඒ අනුව කරුණු දැක්වීමක් නොමැත.

8. **ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති වෙනුවෙන් කරුණු දැක්වීම :-**

2018.07.21 දින මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේදී මහ බැංකුවේ අධිපති වෙනුවෙන් පෙනී සිටි සහකාර අධ්‍යක්ෂ නීති, කේ.ජී.පී. සිරිකුමාර මහතා සහ ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ දිලිනි විලත්ගමුව මිය විසින් පැමිණිල්ලට අදාළව කරුණු ඉදිරිපත් කර ඇත. මහ බැංකුව මෙහිදී කටයුතු කරන්නේ අර්ථ සාධක අරමුදල් පනත යටතේ පැවරී ඇති ව්‍යවස්ථාපිත වගකීම් ඉටු කිරීමයි.

මෙහිදී අරමුදල් සේව්‍යාගෙන් මහ බැංකුවට ලැබීමෙන් පසු ගිණුම් පවත්වාගෙන යාම, එම මුදල් ආයෝජනය කිරීම, කාලීන වාර්තා සාමාජිකයන්ට යැවීම (Periodic Statement) සේවකයන් විශ්‍රාම ගැනීමෙන් පසු කම්කරු දෙපාර්තමේන්තුවේ ගණනය කිරීම්වලට අනුව කරන දැනුම්දීම මත අදාළ පුද්ගලයාට ගෙවීම් සිදු කිරීම යන කරුණු ඉටු කරන අතර, ශ්‍රී ලංකා මහ බැංකුව වෙනත් කිසිදු ගෙවීමක් සිදු නොකරන බව ප්‍රකාශ කර ඇත. 2000 වසරේ සිට කොපමණ මුදලක් මෙම ආයතන තුනේ

සේවකයන්ගේ වැටුපෙන් අඩු කර මහ බැංකුව වෙත එවා තිබේද යන්න ඉදිරිපත් කළ හැකිද යන ප්‍රශ්නයට පිළිතුරු ලෙස දක්වා ඇත්තේ එය නිශ්චිතව ප්‍රකාශ කළ නොහැකි බවයි.

9. රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ ලිඛිත කරුණු දැක්වීම :-

ඉහත පැමිණිල්ලට අදාළව මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සිදු කරන ලද දැනුම්දීම් අනුව ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් පාලනගේ අංක MPED/LES/03/03 මානව හිමිකම් දරණ හා 2017.08.17 දිනැති වාර්තාවේ කරුණු අනුව ජනතා වතු සංවර්ධන මණ්ඩලය, රාජ්‍ය වැවිලි සංස්ථාව හා ඇල්කඩුව වැවිලි සමාගම යටතේ පාලනය වන වතුවල කම්කරුවන්ගේ වැටුපෙන් අඩු කර ගන්නා ලද සේවක අර්ථසාධක අරමුදල් හා සේවා භාරකාර අරමුදල් සහ විශ්‍රාම පාරිතෝෂික දීමනා වැවිලි සමාගම් වල පවතින කළමණාකරණ අකාර්යක්ෂමතා හේතුවෙන් මූල්‍ය දුෂ්කරතා පැනනැගී ඇති බැවින් වැටුප් ගෙවීමට හා ව්‍යවස්ථාපිත වගකීම් නිදහස් කිරීමට වරින් වර මහා භාණ්ඩාගාරය මුදල් ප්‍රතිපාදන ලබා දී ඇති අතර 2000 වර්ෂයේ සිට 2017 ජූලි මස දක්වා ඉහත වැවිලි සමාගම් වෙත පහත ආකාරයට මුදල් ප්‍රතිපාදන ලබා දී ඇති බව ප්‍රකාශ කර ඇත.

| ආයතනය | වැටුප් | ව්‍යවස්ථාපිත ගෙවීම් | එකතුව |
|---|---|---|---|
| ජ.න.ව.ස.ම (JEDB) | රු.මි.1,708.96 | රු.මි.796.36 | රු.මි.2,505.32 |
| ශ්‍රී. ලං.රා.වැ.සං (SLSPC) | රු.මි. 426.00 | රු.මි.648.00 | රු.මි.1,704.00 |
| ඇල්කඩුව වැ. ස. | රු.මි. 422.39 | රු.මි.313.00 | රු.මි. 735.39 |
| එකතුව | රු.මි.2,557.35 | රු.මි.1,757.36 | රු.මි.4,314.71 |

එසේම මෙතෙක් ගෙවා නොමැති ව්‍යවස්ථාපිත දීමනා ගෙවීම සඳහා පහත ආකාරයෙන් මුදල් උපයා ගැනීමට අදහස් කරන බව ප්‍රකාශ කර ඇත.

01. ඉහත ආයතන තුන ප්‍රතිසංවිධානය කිරීමේ අරමුණින් ආරම්භ කරන ලද ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මඟින් වන ඉඩම් බදු දීම තුලින් ලැබෙන මුදල් වලින් ඉහත දීමනා වලින් කොටසක් ගෙවීම.

02. මෙම වර්ෂයේදී සහ ඉදිරි වර්ෂ වලදී වාණිජ වටිනාකමක් ඇති දැව හෙලීම මඟින් ලැබෙන මුදල් යෙදවීම මඟින් කොටසක් ගෙවීම.

03. භාණ්ඩාගාරයෙන් ලබා ගන්නා ප්‍රතිපාදන යෙදවීම මඟින් ඉහත ගෙවීමට ඇති මුදලින් කොටසක් ගෙවීම හා අදාළ ආයතන 3 මඟින් ඉදිරිපත් කර ඇති සැලසුම් අනුව (වසර 2017 සිට 2022 දක්වා) ගෙවීම් කිරීම සිදු කරන බව දන්වා ඇත.

තවද මෙම වැවිලි ආයතන දිගින් දිගටම අලාභ ලබන බැවින් ප්‍රතිව්‍යුහගත කිරීමට වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන ලෙසට රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය වෙත කැබිනට් මණ්ඩලය විසින් දැනුම්දී ඇති බවත් ඒ සඳහා අමාත්‍යාංශය විසින් දැනටමත් කටයුතු කරමින් පවතින බවත් ප්‍රකාශ කර ඇත.

*නිරීක්ෂණ :-*

01. පැමිණිලිකරුවන් මෙම පැමිණිලි ඉදිරිපත් කර ඇත්තේ රජය සතු වැවිලි ආයතන 03 වන ජනතා වතු සංවර්ධන මණ්ඩලය, ඇල්කඩුව වැවිලි සමාගම, රාජ්‍ය වැවිලි සංස්ථාව යන ආයතන වල කම්කරුවන්ට 2000 වසරේ සිට ගෙවිය යතු සේවක අර්ථසාධක අරමුදල්, සේවා භාරකාර අරමුදල්, පාරිතෝෂික දීමනා මේ දක්වා නොගෙවීම සම්බන්ධවයි.

02. වගඋත්තරකරුවන් ලෙස නම් කර ඇති ආයතන විසින් පැමිණිලි පාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති පැමිණිල්ලට අනුව 2000 වසරේ සිට 2017 වසර දක්වා කම්කරුවන්ට ගෙවිය යුතු සේවක අර්ථසාධක, සේවා භාරකාර අරමුදල් හා පාරිතෝෂික දීමනා ගෙවා නොමැති බව පිළිගෙන ඇත.

03. මෙම දීමනා නොගෙවා සිටීමට හේතු ලෙස වගඋත්තරකාර වැවිලි ආයතන ප්‍රකාශ කර ඇත්තේ, ඔවුන්ට සේවකයන්ගේ වැටුප් හා ව්‍යවස්ථාපිත දීමනා ගෙවීමට ප්‍රමාණවත් ආදායම් එම ආයතන වලට නොලැබෙන බැවින් මෙම ගැටලුව පැන නැගී ඇති බවයි. නමුත් මේ සඳහා වරින් වර භාණ්ඩාගාරයෙන් මුදල් මෙම ආයතනවලට ලබා දුන්නද, අදාළ දීමනා ගෙවීමට මෙම මුදල් ප්‍රමාණවත් වී නොමැති බව නිරීක්ෂණය වේ.

04. මෙම ව්‍යවස්ථාපිත දීමනා ගෙවීම පැහැර හැරීම සිදුවන අවස්ථාවලදී ඉහත පනත් මඟින් පනවා ඇති නෛතික ප්‍රතිපාදන අනුව කම්කරු කොමසාරිස්වරයා විසින් ඒ පිළිබඳ පියවර ගතයුතු වන අතර, ගෙවීම් පැහැර හරින ආයතනවලට විරුද්ධව අධිකරණයේ නඩු කටයුතු ගොනු කළයුතුය. මෙහිදී අධිකරණය හමුවේ යම් පැමිණිලි ප්‍රමාණයක් ගොනු කර සහන ලබා ඇති පිරිසක්ද තවදුරටත් අධිකරණයේ නඩු කටයුතු විභාග වෙමින් පවතින පිරිසක්ද, අධිකරණය හමුවේ නඩු කටයුතු ගොනු කර නොමැති පිරිසක් ද, සිටින බව නිරීක්ෂණය වේ.

05. වගඋත්තරකරුවන් නිසි පරිදි අධිකරණයට ඉදිරිපත් නොවීම, අදාළ ආයතන මූල්‍ය අර්බුදයකට ලක් වී තිබීම යන කරුණු හේතුකොටගෙන අධිකරණයේ නඩු කටයුතු ප්‍රමාද වන බව වගඋත්තරකාර පාර්ශවයන් විසින් ඉදිරිපත් කර ඇති කරුණු අනුව නිරීක්ෂණය වේ.

06. සේවක අර්ථසාධක අරමුදල් පනත අනුව සේවකයාගේ දායකත්වය 8% ක මුදල, ආයතනය විසින් අයකරගෙන ඇතත්, එම මුදල්වත් නිසි පරිදි මහ බැංකුව වෙත තැන්පත් කර නොමැති බව වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම් අනුව නිරීක්ෂණය වේ. ඒ අනුව මෙම වැවිලි ආයතන 2000 වසරේ සිට මෙම සේවකයන්ගේ කම්කරු අයිතිවාසිකම් උල්ලංඝනය කරමින් ඔවුන් සතු වගකීම් පැහැර හැර ඇති බව නිරීක්ෂණය වේ.

07. මෙම වැවිලි ආයතනවල කළමණාකාරීත්වයේ ඇති දුර්වලතා හා අනවශ්‍ය ලෙස මුදල් භාවිතා කිරීම මත පාඩු ලබන තත්ත්වයට පත්වී ඇති බව වැවිලි සමාගම් හැර මෙම පැමිණිල්ලේ අනෙකුත් වගඋත්තරකාර රාජ්‍ය ආයතන විසින් කොමිෂන් සභාව හමුවේ පැවැති පරීක්ෂණයේදී ප්‍රකාශ කර ඇත.

08. සේවකයා වෙත සේවක අර්ථසාධක අරමුදල් හා සේවා භාරකාර අරමුදල් ගෙවීම් සම්බන්ධයෙන් වාර්ෂික, අර්ධ වාර්ෂික සාමාජික ගිණුම් ප්‍රකාශ නිකුත් කළයුතු වුවද, මෙම සේවකයන් වෙත 2001 වර්ෂයෙන් පසුව එම වාර්තා ලැබී නොමැති බව පැමිණිලි පාර්ශවය ප්‍රකාශ කර ඇති අතර, මහ බැංකුව වෙනුවෙන් පෙනී සිටින නිලධාරීන් ප්‍රකාශ කර ඇත්තේ එම ලේඛන සේව්‍යයා වෙත යොමු කිරීමෙන් පසු සේවකයා වෙත ලබාදෙනු ලබන බවයි.

සේව්‍යයා විසින් එම ලේඛන ලබාදී නොමැති නම් සේවකයාට ඒ පිළිබඳව විමසීමට අයිතියක් ඇති බව ප්‍රකාශ කර ඇත. එමෙන්ම හිඟ සේවක අර්ථසාධක අරමුදල් හා සේවා භාරකාර අරමුදල් අයකරදීමේ වගකීමත් මහ බැංකුව සතු නොවන බවත් කම්කරු කොමසාරිස්වරයා විසින් සපයනු ලබන ලිඛිත උපදෙස් අනුව විශ්‍රාම ගන්නා සේවකයන් වෙත සේවක අර්ථසාධක අරමුදල් හා භාරකාර අරමුදල් ගෙවීම පාරිතෝෂික ගෙවීම හා ගිණුම් පවත්වාගෙන යාම සිදුකරන බවයි.

මෙහිදී නිරීක්ෂණය වන්නේ මහ බැංකුව මඟින් වාර්ෂිකව සාමාජික ගිණුම් ප්‍රකාශ ලබා දී ඇති බව තහවුරු කර නොමැති බවත් සේව්‍යයා විසින් හෝ මහ බැංකුව විසින් මෙම වාර්ෂික සාමාජික ගිණුම් ප්‍රකාශ සේවකයන් වෙත ලබාදීම පැහැර හැර ඇති බවත්ය.

09. මහා භාණ්ඩාගාරය විසින්, ලාභ ඉපැයීමේ පරමාර්ථය මත පිහිටුවා ඇති ආයතන වෙත භාණ්ඩාගාරය මුදල් ප්‍රතිපාදන ලබා නොදුන්නද, මෙම වැවිලි ආයතන 03 දිගින් දිගටම ලාභ නොලැබීම මත අර්බුදයකට මුහුණ දී ඇති බැවින් වරින් වර මුදල් ප්‍රතිපාදන ලබාදී ඇතත්, එම මුදල් ප්‍රතිපාදන සේවක අර්ථසාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල් ගැටළුව විසඳීමට ප්‍රමාණවත් වී නොමැති බව නිරීක්ෂණය වේ.

10. සේවක අර්ථසාධක අරමුදල, සේවක භාරකාර අරමුදල්, පාරිතෝෂික මුදල් විශ්‍රාම ලබා මාසයක කාලයකින් ගෙවියයුතු වුවද වසර ගණනාවක් එම මුදල් ප්‍රමාද වීමට විසඳුමක් ලබාදීමට රජයේ වගකිවයුතු ආයතන අපොහොසත් වී ඇත.

මෙම වැවිලි කම්කරුවන් විදේශ අපනයන ආදායම ඉහළ නැංවීමට සෘජුවම දායක වන පිරිසක් වන අතර, ඔවුන් අඩු ආදායම් ලාභීන් ලෙස ඉතා අවම පහසුකම් යටතේ ජීවත් වේ. මොවුන් වයස්ගතව විශ්‍රාම යාමෙන් පසුව හිමිවිය යුතු නෛතික දීමනා නොගෙවා සිටීම ඔවුන්ට සිදු කරන බලවත් අසාධාරණයක් හා වෙනස්කොට සැලකීමක් බව නිරීක්ෂණය වේ.

11. වතු කම්කරු ජනතාව අවධානමකට ලක්විය හැකි පිරිසක් (Vulnerable Group) ලෙස හඳුනාගෙන ඇති අතර ඔවුන්ට තම අයිතීන් වෙනුවෙන් හඬක් නැඟීමට ඇති අවස්ථා සීමා සහිත වේ. එවැනි කණ්ඩායමකගේ අයිතිවාසිකම් උල්ලංඝනය වීම බරපතල කාරණයක් බැවින් රජය ඒ පිළිබඳව විශේෂ අවධානය යොමු කළ යුතුය.

12. මෙම ගැටළුවට මුහුණපා සිටින සේවක සංඛ්‍යාව දළ වශයෙන් 12000 ක් පමණ බවත් එක් එක් ආයතන විසින් ගෙවීමට ඇති මුදලෙහි එකතුව දළ වශයෙන් රුපියල් මිලියන 1888 පමණ වන බවත් පැමිණිල්ලෙන් කරුණු දක්වා ඇත. වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම් අනුව එම මුදල රුපියල් මිලියන 1888 ට වඩා අධික බව නිරීක්ෂණය වේ.

13. වගඋත්තරකාර ආයතනයන් විසින් මෙම මුදල් ගෙවීම සඳහා ඉදිරියේදී කටයුතු කිරීමට බලාපොරොත්තු වන ආකාරය රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කර ඇති අතර, එම වැඩපිළිවෙල සාර්ථක කර ගැනීමට අදාළ සියළු ආයතන එක්ව කටයුතු කිරීමටද අවශ්‍ය අවස්ථාවන්හිදී කැබිනට් අනුමැතිය ලබාගැනීමට කටයුතු කළයුතුව ඇති බව නිරීක්ෂණය වුවද එවැන්නක් සිදුවී නොමැත.

14. එමෙන්ම ව්‍යවස්ථාපිත දීමනා ගෙවීම මෙතරම් ප්‍රමාදවීම සම්බන්ධයෙන් හා මෙම ගෙවීම් පැහැර හැරීම පිළිබඳ නිසි අධීක්ෂණ සිදු කොට මුල් අවස්ථාවේදී ක්ෂණිකව ගතයුතු ක්‍රියාමාර්ග නොගැනීම පිළිබඳව කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින්ද තවදුරටත් මෙම ගැටළුව විසඳීම අපොසත්වීම මෙහි සියලු වගඋත්තකාර පාර්ශවයන් යම් යම් ප්‍රමාණයෙන් වගකිවයුතු බව නිරීක්ෂණය වේ.

15. සේවක අර්ථසාධක අරමුදල, සේවක භාරකාර අරමුදල හා පාරිතෝෂික දීමනා නොගෙවීම සම්බන්ධයෙන් පුද්ගලික අංශයේ ආයතන වෙත නඩු පැවරීමෙන් පසු ඒවා ගෙවීම පැහැර හරින ආයතන ප්‍රධානීන් වෙත අධිකරණය විසින් දඩුවම් නියම කරනු ලබයි. නමුත් මෙම ආයතන රජයේ වැවිලි සමාගම් වන බැවින් අධිකරණය විසින්ද මෙම නඩු විසඳීමේදී ලිහිල් ප්‍රතිපත්තියක් අනුගමනය කර ඇති බව නිරීක්ෂණය වේ.

16. රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය විසින් සිදු කරන ලද ලිඛිත කරුණු දැක්ම අනුව මෙම ව්‍යවස්ථාපිත දීමනා ගෙවීම සඳහා මෙම වැවිලි සමාගම් බදු දීම මඟින් මුදල් උපයාගැනීමටද වාණිජ වටිනාකමක් ඇති දැව හෙලීම හා ඒවා අලෙවි කිරීම මඟින් මුදල් උපයාගැනීමටද යෝජනා කර ඇතත්, එම යෝජනා ප්‍රායෝගික නොවන බැවින් මේ සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරයෙන් වෙන්කළ යුතුව ඇති බව නිරීක්ෂණ වේ.

නෛතික කරුණු දැක්වීම.

01. මානව හිමිකම් කොමිෂන් සභාව මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 10 (අ) (ආ) (ඇ) වගන්ති කෙරේ අවධානය යොමු කරමින් එම පනතේ 11 (අ) 11 (ඌ) වගන්ති අනුව පනතේ 14 වගත්තිය යටතේ විමර්ශනය සිදුකොට මෙම නිර්දේශය නිකුත් කරනු ලබයි.

02. වගඋත්තරකරුවන් විසින් මෙම සේවකයන්ගේ සේවක අර්ථසාධක අරමුදල්, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල හා පාරිතෝෂික දීමනා නොගෙවා සිටීම 1958 අංක 15 දරණ සේවක අර්ථ සාධක අරමුදල් පනත, 1980 අංක 46 දරණ සේවක භාරකාර අරමුදල් පනත, 1983 අංක 12 දරණ විශ්‍රාම පාරිතෝෂික දීමනා පනත උල්ලංඝනය කිරීමකි.

03. ඉහත පනත් ප්‍රකාරව සේවක අර්ථසාධක මුදල සඳහා සේව්‍යා විසින් 12% ක ප්‍රතිශතයක්ද,සේවකයන්ගේ දායකත්වය වැටුපෙන් 8%ක මුදල සේවකයා විසින්ද, ගෙවියයුතු වේ. සේවක භාරකාර අරමුදලට 3%ක ප්‍රතිශතයක් සේව්‍යයා විසින් බැර කළ යුතු වන අතර, පාරිතෝෂික දීමනාව සේවා කාලය වසර 5 සම්පූර්ණ කළ සේවකයන්ට සේවය කර ඇති වසර ගණනට අනුපාතිකව ගෙවීම් සිදුකළ යුතුය.

04. සේවක අර්ථසාධක අරමුදල් සහ සේවක භාරකාර අරමුදල් අවුරුදු 01 කට වඩා වැඩි කාලයක් නොගෙවන අවස්ථා වලදී 50% ක දඩ මුදලක් ගෙවීමට සේව්‍යායට සිදුවේ. පාරිතෝෂික දීමනා ගෙවීම අවුරුදු 01 ක කාලයක් ප්‍රමාද වූ විට 30% ක අධිභාරයක් පනවනු ලැබේ. මෙලෙස දඩ මුදල් නියම කර ඇත්තේ, සේව්‍යා විසින් මෙම දීමනා ප්‍රමාදයකින් තොරව සේවකයා වෙත ගෙවීමට උනන්දු කරවීමට හා පනතේ අරමුණ වී ඇත්තේ, සේවකයන්ගේ සුභසාධනය නගාසිටුවීමට බව ඉහත පනත් තුන අධ්‍යයනය කිරීමේ දී පැහැදිලිව පෙනී යයි.

05. මෙම පැමිණිලිකරුවන්ට අදාළ ව්‍යවස්ථාපිත දීමනා (සේවක අර්ථසාධක අරමුදල, සේවක භාරකාරත්ව අරමුදල, සේවක පාරිතෝෂික දීමනා) ගෙවීම පැහැර හැරීම, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) වන ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමකි. 12(1) ව්‍යවස්ථාව අනුව නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීමද, නීතියේ රැකවරණයද, සර්ව සාධාරණ විය යුත්තේය යනුවෙන් දක්වා ඇත.

06. ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටක් ලෙස මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශ්ව ප්‍රකාශයේ සඳහන් මානව හිමිකම් ආරක්ෂා කිරීමටද, ආර්ථික සාමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය හා ජාත්‍යන්තර කම්කරු ප්‍රඥප්තිය මඟින් ආරක්ෂා කර ඇති අයිතිවාසිකම් ආරක්ෂා කිරීමටද, වගකීමෙන් බැඳී ඇත.

නිගමන හා නිර්දේශ :-

1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ I වන පරිච්ඡේදයේ 4. (ඇ) අනුව "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ප්‍රකාශ කොට පිළිගනු ලබන මූලික අයිතිවාසිකම් සියලු පාලන ආයතන විසින් ගරු කරනු ලැබිය යුත්තේයෙ, ආරක්ෂා කරනු ලැබිය යුත්තේය, වර්ධනය කරනු ලැබිය යුත්තේය. තවද ඒ මූලික අයිතිවාසිකම් මෙහි මින්මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයට සහ ප්‍රමාණයට මිස සංක්ෂිප්ත කිරීම, සීමා කිරීම හෝ අහිමි කිරීම නොකළ යුත්තේය." යනුවෙන් දක්වා ඇත.

පැමිණිලි පාර්ශවය හා වගඋත්තර පාර්ශවයන් විසින් ඉදිරිපත් කර ඇති සියළු කරුණු සලකා බැලීමේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව අනුව "නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීමද, නීතියේ රැකවරණයද සර්ව සාධාරණ විය යුත්තේය" යන මූලික අයිතිවාසිකම වගඋත්තරකරුවන් විසින් උල්ලංඝනය කර ඇති බවට නිගමනය කරනු ලැබේ.

ඒ අනුව මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කරනු ලැබේ.

1. ජනතා වතු සංවර්ධන මණ්ඩලය, රාජ්‍ය වැවිලි සංස්ථාව, ඇල්කඩුව වැවිලි සමාගම යන වගඋත්තරකාර ආයතන විසින් එම වතු සමාගම්වල සේවය කළ සේවකයන් 12000කට පමණ 2000 වර්ෂයේ සිට මේ දක්වා ගෙවා නොමැති සේවක අර්ථසාධක අරමුදල්, සේවක භාරකාර අරමුදල් හා පාරිතෝෂික දීමනා කොපමණද යන්න ගණනය කර, එම මුදල් රාජ්‍ය භාණ්ඩාගාරයෙන් වසර එකහමාරක් තුළ අධියර තුනකින් පහත ආකාරයට ගෙවා අවසන් කිරීමට නිර්දේශ කරනු ලැබේ.

    2000 වර්ෂයේ සිට 2006 වර්ෂය දක්වා ඉහත ව්‍යවස්ථාපිත දීමනා ගෙවා නොමැති සේවකයන්ට 2020 ජනවාරි මස 01 වන දින සිට 2020 ජූනි මස 30 අතර කාල සීමාව තුළද,

    2007 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා ඉහත ව්‍යවස්ථාපිත දීමනා ගෙවා නොමැති සේවකයන්ට 2020 ජූනි මස 01 වන දින සිට 2020 දෙසැම්බර් මස 30 අතර කාල සීමාව තුළද,

    2013 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා ඉහත ව්‍යවස්ථාපිත දීමනා ගෙවා නොමැති සේවකයන්ට 2021 ජනවාරි මස 01 වන දින සිට 2020 ජූනි මස 30 අතර කාල සීමාව තුළද, ගෙවා අවසන් කළ යුතුය.

2. දැනට ඉහත ආයතන තුනෙහි සේවය කරන සේවකයින්ගෙන් අයකරගන්නා සේවක අර්ථසාධක අරමුදලේ 8% ප්‍රතිශතයද, සේව්‍යා විසින් ගෙවනු ලබන 12% ක ප්‍රතිශතය හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ දායක මුදල් 3% ක ප්‍රතිශතයද මින් ඉදිරියට ප්‍රමාදයකින් තොරව නිසි පරිදි මහ බැංකුව වෙත ප්‍රේෂණය කිරීමට 1, 2, 3 වගඋත්තරකරුවන් වෙත නිර්දේශ කරන අතර කම්කරු කොමසාරිස්වරයා විසින් අදාළ පනත් ප්‍රකාරව අධීක්ෂණ කටයුතු සිදුකර නිසි පියවර ගත යුතු බවට නිර්දේශ කරනු ලැබේ.

3. කම්කරු කොමසාරිස් දෙපාර්තමේන්තුව හා මහබැංකුව විසින් ඉදිරියේදී සේවකයන් වෙත ලබාදියයුතු සේවක අර්ථසාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල් පිළිබඳ වාර්ෂික හා අර්ධ වාර්ෂික සාමාජික ගිණුම් ප්‍රකාශන සේව්‍යයාට මෙන්ම සේවකයා වෙතද සෘජුවම ලබාදීමට වැඩ පිළිවෙලක් සකස් කොට පොදුවේ සියළුම ආයතන වලට බලපැවැත්වෙන පරිදි නීති ක්‍රියාත්මක කිරීම.

1 සිට 9 දක්වා වගඋත්තරකරුවන් විසින් ඉහත සඳහන් 1 වන නිර්දේශය 2020 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක කර 2021 ජූනි 30 දින වන විට සියළු ගෙවීම් අවසන් කළ යුතු වන අතර ඒ සම්බන්ධ වාර්තාවක් 8 වන වගඋත්තරකරු විසින් කොමිෂන් සභාවට ලැබීමට සැළැස්විය යුතු බවටද 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව 1 සිට 09 දක්වා වන වගඋත්තරකරුවන් වෙත දන්වමු.

ඉහත 2 නිර්දේශය 1, 2, 3 වගඋත්තරකරුවන් විසින්, මෙම නිර්දේශය නිකුත් කර එක් මසක කාලයක් තුළ ක්‍රියාත්මක කිරීම ආරම්භ කළයුතු වන අතර, 7 වන වගඋත්තරකරු විසින් මේ පිළිබඳව අධීක්ෂණ කටයුතු සිදුකර මාස 6 ක කාලයක් ඇතුළත කොමිෂන් සභාවට වාර්තා කළ යුතු බවද දන්වමු.

ඉහත 3 නිර්දේශය 7 හා 8 වගඋත්තරකරුවන් විසින් මාස 3 ක කාලයක් තුළ ක්‍රියාත්මක කර කොමිෂන් සභාව වෙත වාර්තා කළ යුතුය.

රමණී මුත්තෙට්ටුවේගම,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

එච්. ගසාලි හුසේන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත්:

1. අතිගරු ජනාධිපතිතුමා,
   ජනාධිපති මන්දිරය,
   කොළඹ 01.

2. ගරු අගමැතිතුමා,
   අරලියගහ මන්දිරය,
   කොළඹ 03.

3. ගරු කථානායකතුමා,
   කථානායක නිල නිවස,
   බත්තරමුල්ල.

4. ගරු අමාත්‍යතුමා,
   කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය,
   2 වන මහල, කම්කරු මහලේකම් කාර්යාලය,
   කොළඹ 05.

B/